**සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය - 2018**

**------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මතය ව්‍යාචනය

**-----------------**

සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනයේ (''සමාගම'') 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

**-------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 09 වන ඡේදය ප්‍රකාරව අවසන් තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මැනිය යුතු වුවත් වසර 20 කට අධික කාලයක් තිස්සේ පාවිච්චියට නොගෙන තොග ගබඩාවේ පැවති තොග පිරිවැයට ගණනය කර රු.47,440,818 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 1994.03.31 දින ආයතනය වසා දැමූ අතර 1997 වර්ෂයේ අලුතින් පැමිණි සභාපතිවරයා විසින් සියලුම ගබඩා සහ ගොඩනැගිලි වල තොග සමීක්ෂණයක් සිදුකර ඒවා සීල් තබා වසා දමන ලදී එයින් පසුව තොග සමීක්ෂණ කටයුතු සිදු නොකළ අතර යල්පැනගිය තොග සඳහා කපාහැරීමක් නොකරන ලදි. එබැවින් මෙම තොගයේ වටිනාකම වෙනසක් සිදු නොවුණි. | කර්මාන්තායතනය සතු ගබඩා වල පවතින තොග ද්‍රව්‍යයන් පිළබඳ සමීක්ෂණයක් සිදුකර නිවැරදි තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයට අදාළ ගෙවිය යුතු අතිකාල රු.1,987,206 ක් වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම වටිනාකම රු.1,927,252 ක් ලෙස රු.59,954 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 වර්ෂයට අදාල ගෙවිය යුතු අතිකාල පහත දැක්වේ.<br>01 169,376   07 153,123<br>02 177,216   08 149,871<br>03 176,302   09 117,375<br>04 219,646   10 157,229<br>05 148,648   11 141,298<br>06 146,957   12 165,133<br>එකතුව 1,922,154<br>සුලු මුදල් ප්‍ර:කා ගෙව්වා 5,098<br>1,927,252<br>මේ අනුව මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති වටිනාකම නිවැරදි බව දන්වමි. | ගෙවිය යුතු අතිකාල නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණු රු.840,774 ක ශේෂය හඳුනාගෙන අදාළ ගිණුම්වලට ගැලපීම් කර නොතිබුණි. | 1994.04.01 දින සිට කන්තලේ සීනි කර්මාන්තායතනය වසා දමා ඇති බැවින් එදිනෙන් පසුව ඉදිකිරීම් සිදු නොවන කෙරීගෙන යන වැඩ රු. 840,774 ක මුදලෙන් සාදා ඇති ගොඩනැඟිල්ල සාදා අවසන් වීද යන්න විස්තර සිවිල් ඉංජිනේරු අංශයෙන් ලබාගැනීමට හැකියාවක් නොමැත. | 2005 වර්ෂයේ සිට ගිණුම් වල පවතින කෙරීගෙන යන වැඩ නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.3** **නොසැසඳු වාර්තා**

| **විෂය** | **මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.** | **අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.මිලිය** | **වෙනස රු.** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|
| දේපළ පිරියත සහ උපකරණ | 73,849,491 | 540 | 466,150,509 | 2007 සහ 2017 වර්ෂවල අප අමාත්‍යාංශය අයත්ව තිබූ අමාත්‍යාංශය මඟින් වත්කම් තක්සේරු දෙපාර්තමේන්තුව යටතේ තක්සේරු කර ඇතත් එහි වටිනාකම පිළිබඳව අප ආයතනයට කිසිදු දැනුම්දීමක් කර නැත. | කර්මාන්තායතනය සතුව පවතින වත්කම් තක්සේරු කර සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කළ යුතුය. |

**1.5.4** **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.16,598,342 ක වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථන කිරීම් ලිපි විගණනය වෙත ඉදිරිපත් නොවුණි. | වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ රු 16,598,342<br>කාර්මික ස: මණ්ඩලයට විකිණීමේදී වැඩිපුර රු.16,598,342 ක මුදලක් ආයතනය වෙත ලබාදී ඇත. ඒ සඳහා නැවත එම ආයතනය වෙත යකඩ නිකුත් කිරීමක් සිදු නොවින. එබැවින් අප ආයතනය එම මුදල ගෙවිය යුතුව ඇත. | ගිණුම් වල පෙන්වනු ලබන ශේෂය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය විගණන සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1993 වර්ෂයේ සිට පැවත එන රු.42,183,209 ක් වූ ලැබිය යුතු සහ ඉදිරියට කළ ගෙවීම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.42,183,209 ක මුදලෙහි කන්තලේ ආයතනය පෙර ලබාගත් ආයෝජකයෙකු වන සුමණසේකර මහතාගෙන් අයවිය යුතු රු.14,036,375 ක මුදල සඳහා විස්තර වාර්තාවක් ඉදිරිපත් කර ඇත. මෙම මුදල් අයකර ගැනීම සඳහා සුමණසේකර මහතාට විරුද්ධව කන්තලේ ආයතනය විසින් කොළඹ දිසා අධිකරණයෙහි පවරන ලද අංක 3805 නඩුවට මෙම අයවීම් පිළිබඳව ඇතුළත්ව ඇතත් නඩුව වසර 20 ක් පමණ ගතවී ඇති බැවින් ඉදිරියට ක්‍රියාකිරීමට නොහැකි බව ගරු නීතිපති දෙපාර්තමේන්තුව විසින් පවසා ඇත. එබැවින් මෙම මුදල් අයකර ගැනීමට නොහැකි විය. | අයවීමට ඇති මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 වර්ෂයේ සිට ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවියයුතු ලෙස දක්වා ඇති රු.76,352,246 ක ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | සී/ස කන්තලේ සීනි කර්මාන්තායතනය විසින් ල.වි.ම ගෙවිය යුතු රු.76,353,246 ක මුදල අයකර ගැනීම සඳහා ල.වි.ම විසින් නඩු පැවරීමට ගරු නීතිපති වරයාගෙන් උපදෙස් ඉල්ලා ඇති අතර එකී ඉල්ලීම රාජ්‍ය ආයතන දෙකක් අතර බැවින් සාකච්ඡාකර තීරණයක් ගැනීමට උපදෙස් ලබාදී ඇත. | 2010 වර්ෂයේ සිට ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවිය යුතු මුදල තුල ඇතුළත් යුධ හමුදාවෙන් අයකරගත යුතු රු.44,839,081 ක ප්‍රමාණය ගෙන්වා ගෙන නොපමාව සම්පූර්ණ ශේෂය පියවිය යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | 1997 වර්ෂයෙන් පසු තොග හා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් භෞතික | කන්තලේ කර්මාන්තායතනයේ 1994.03.31 දින සිට වසා දැමූ අතර 1997 වර්ෂයේ අළුතින් පැමිණි | මුදල් රෙගුලාසි ප්‍රකාරව භෞතික තොග සමීක්ෂණයක් සිදු කර |

| | | | |
|---|---|---|---|
| සංග්‍රහය මු.රෙ 756 | සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. | සභාපතිවරයා විසින් සියලුම ගබඩාවල සහ ගොඩනැඟිලි වල තොග සමීක්ෂණයක් සිදු කර එම ගබඩා සීල් තබා වසා දමන ලදී. ඉන් පසුව වාර්ෂිකව තොග සමීක්ෂණ කටයුතු සිදු නොකළ අතර 2007 සහ 2017 වර්ෂ වල වත්කම් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර අමාත්‍යාංශය වෙත යවා ඇත. | තොගයේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට හා අවශ්‍ය ගැලපීම කිරීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 13,192,264 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,769,102 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,423,162ක ඌණතාවයේ වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට භාණ්ඩාගාර ලැබීම් රු.11,852,097 ක් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂ 25 කට ආසන්න කාලයක සිට කිසිදු නිෂ්පාදන කාර්යයකට දායකත්වයක් නොමැතිව වසා දමා ඇති කන්තලේ සීනි කර්මාන්ත ශාලාව නැවත ආරම්භ කර එමගින් දේශීය සීනි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා සිදු කරන ලද ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ ආයෝජකයින් විසින් ඇමරිකානු ඩොලර් මිලියන 100 ක් ආයෝජනය කරමින් වර්ෂ 5 ක් තුළ මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ යුතුව තිබුණද එවැනි කිසිදු ආයෝජනයක් 2020 ජනවාරි 31 දින වන විටත් සිදු වී නොමැති අතර කර්මාන්ත ශාලාවට අයිතිව තිබූ සියලුම යන්ත්‍රෝපකරණ ඇතුළු ගොඩනැඟිලි වල අයිතියද ශ්‍රී ලංකා රජයට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. එසේම කිසිදු නිෂ්පාදනයක් සිදු නොවන මෙම කර්මාන්තායතනයේ සේවයේ නියුතු සේවකයින් සඳහා 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා | පිළිතුරු ලබා දී නොමැත. | දේශීය සීනි නිෂ්පාදනය වැඩිදියුණුකිරීම සඳහා මෙම කර්මාන්තායතනය කඩිනමින් ප්‍රතිව්‍යුහගත කර නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 40.392 ක මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | | |
| (ආ) කන්තලේ සීනි කර්මාන්තශාලාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ආයෝජකයකු තෝරා ගැනීමේදී විවෘත ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය නොකර ඉඩම් අමාත්‍යාංශය සහ ආයෝජන මණ්ඩලය වෙත සෘජුව ලැබුණු අයදුම්පත් දෙකක් පදනම් කරමින් ආයෝජන ඇගයීම සිදුකර තිබුණි. මෙහිදී ආයෝජනය සඳහා යෝජනා කැඳවීම ප්‍රමාණවත් විනිවිදභාවයකින් තොරව සිදුවී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. තවද මෙම ක්‍රියාවලියට අදාළ කිසිදු ලියවිල්ලක් ඉඩම් අමාත්‍යාංශය සතුව නොමැති බව විගණනයට දන්වා තිබුණි. | ආයෝජන මණ්ඩලය :<br>ඉඩම් අමාත්‍යවරයා විසින් 2015 පෙබරවාරි මස 14 වන දින කන්තලේ සීනි කර්මාන්ත ශාලාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වන කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන විට, ආයෝජන මණ්ඩලය ඒ පිළිබඳව පූර්ව දැනුවත් බවක් හෝ එම පත්‍රිකාවට සම්බන්ධ වීමක් නොමැති අතර, කෙසේ වෙතත් අදාළ ව්‍යාපෘතිය ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස ලියාපදිංචි කළ යුතු බව සඳහන් වී තිබුණි.<br><br>ඉඩම් අමාත්‍යාංශය :<br>අමාත්‍යාංශ විෂය පථයන් සංශෝධනය වීම නිසා කන්තලේ සීනි සමාගමට අදාළ සියලු ලිපිගොනු 2018.04.24 දින ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය වෙත භාරදී ඇත. එබැවින් විමසුමට පිළිතුරු ලබාදීමට හැකියාවක් නොමැති බව දන්වා ඇත. | පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර විනිවිදභාවයකින් යුක්තව සුදුසු ආයෝජකයෙකු තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2016 අගෝස්තු 01 දින නීතිපති දෙපාර්තමේන්තුව විසින් දෙන ලද නිෂ්කාශන බැහැර කරමින් මුදල් අමාත්‍යාංශයේ එවකට හිටපු නීති උපදේශක විසින් කන්තලේ සීනි කර්මාන්තායතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ කොටස්කාර ගිවිසුම පිළියෙල කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද නීතිපති දෙපාර්තමේන්තුව විසින් 2016 අගෝස්තු 01 දින දෙන ලද නිෂ්කාශනයට අදාළ තාක්ෂණික හා වාණිජ කරුණු පිළිබඳ වැඩිදුර අධ්‍යයනයකින් තොරව, 2016 අගෝස්තු 04 දින නිෂ්කාශනයක් ඉදිරිපත් කරමින් මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීමට නීතිමය අවහිරතාවයක් නොමැති බව දන්වා ඇති බව නිරීක්ෂණය විය. | මුදල් අමාත්‍යාංශය :<br>2016.08.01 දිනැතිව නීතිපති දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද ඔවුන්ගේ නිරීක්ෂණ ඇතුළත් ලිපියට පිළිතුරු ලෙස උක්ත සඳහන් කළ නීති උපදේශක විසින් නීතිපති දෙපාර්තමේන්තුවට පිළිතුරු ලිපියක් යවා ඇති බවත් එකී පිළිතුරු ලිපියේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් හෝ වෙනත් නිලධාරියෙකු දැනුවත් කොට නොමැති බවත් ලිපිගොනු අනුව පෙනී යයි.එසේම, එම නීතිපතිගේ නිරීක්ෂණ ද කොටස්කාර ගිවිසුමට ඇතුළත් කිරීම සිදු කොට නොමැති බවද පෙනී යයි.එසේම, අවසන් ගිවිසුම අත්සන් කරන අවස්ථාවේදී ද එම | මුදල් අමාත්‍යාංශයේ නීති උපදේශක විසින් නීතිපතිගේ නිෂ්කාශණ සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීමේදී මුදල් අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර ඒ සඳහා අනුමැතිය ලබාගත යුතුව තිබුණු අතර අවසාන කොටස්කාර ගිවිසුම අත්සන් කිරීමට පෙර එහි සඳහන් කොන්දේසි පිළිබඳව පරීක්ෂා කර බැලිය යුතුව තිබුණි. |

2016.08.01 දිනැති නීතිපති නිරීක්ෂණ මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අවධානයට ලක් කොට නොමැති බවද නිරීක්ෂණය වේ.

නීතිපති දෙපාර්තමේන්තුව :
ඉහත කී ගිවිසුම අධ්‍යානය කිරීමේදී නීතිපතිගේ වගකීම් වනුයේ එහි නීත්‍යානුකූල බව පරීක්ෂා කිරීම වේ. මේ සඳහා අදාළ කැබිනට් පත්‍රිකා හා අනුමැතිය ඇත්දැයි පරීක්ෂා කරන අතර, මෙම ගිවිසුම ලංකාවේ නීති වලට පටහැනි ද යන්න පරීක්ෂා කරන ලදී. එසේ කිරීමේදී මෙම ගිවිසුම සම්බන්ධයෙන් 2016.08.01 ලිපිය මඟින් මෙම දෙපාර්තමේන්තුවේ මූලික අදහස් පල කරන ලදී. අදාළ ගිවිසුමේ 7.1.0 වගන්තිය කෙටුම්පත් කළ යුතු ආකාරය සම්බන්ධයෙන් අදහස් පල කළ නමුත්, එය ගිවිසුමේ නීතිමය බවට කළ නිගමනයක් නොවේ. පසුව 2016.08.04 වන දිනැති ලිපිය මඟින් දන්වා ඇත්තේ, මෙම ගිවිසුමට නීතිමය බාධාවක් නොමැති බවත්, එකී ගිවිසුමේ වාණිජමය හා තාක්ෂණික කරුණු සම්බන්ධව අදහස් පල නොකරන බවත්, එම කරුණු මුදල් අමාත්‍යාංශය මඟින් සලකා ඇති බව උපකල්පනය කරන බවත්ය. ඒ හෙයින්, මෙම ගිවිසුමේ අඩංගු තාක්ෂණික හා වාණිජමය කටයුතු පිළිබඳව නීතිපති වග නොකියන බවට අදහස් වන්නේ ය.

| | | |
|---|---|---|
| (ඇ) නීතිපති දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරන ලද නිරීක්ෂණ ඇතුළත් ලිපියට පිළිතුරු ලෙස මුදල් අමාත්‍යාංශයේ හිටපු නීති උපදේශක විසින් නීතිපති දෙපාරේතමේන්තුවට යවා තිබුණ පිළිතුරු ලිපියේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් හෝ වෙනත් නිලධාරියෙකු දැනුවත් කොට නොතිබූ බව නිරීක්ෂණය විය. එමෙන්ම අවසන් ගිවිසුම | පිළිතුරු ලබාදී නොමැත. | අවසාන කොටස්කාර ගිවිසුම අත්සන් කිරීමට පෙර නීති උපදේශක විසින් එම ගිවිසුමේ සඳහන් වගන්ති පිළිබඳ අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුව තිබුණි. |

| | | |
|---|---|---|
| අත්සන් කරන අවස්ථාවේදීද ඉහත 2016.08.01 දිනැති නීතිපති නිරීක්ෂණ භාණ්ඩාගාර ලේකම්ගේ අවධානයට ලක් කොට නොමැති බව නිරීක්ෂණය විය. | | |
| (ඉ) ආයෝජකයා විසින් කර්මාන්තශාලාවට අවශ්‍ය යන්ත්‍රෝපකරණ රැගෙන ආ යුතු බවට දක්වා ඇති කොන්දේසියට පටහැනිව ආයෝජකයාට දැනට පවත්නා යන්ත්‍රසූත්‍ර භාවිතයට ගැනීමට හැකියාවක් ඇති බවට වගන්තියක් මුදල් අමාත්‍යාංශයේ හිටපු නීති උපදේශක විසින් අත්සනට එළඹි ගිවිසුමෙහි ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය විය. එහෙත් එම වගන්තිය නිෂ්කාශනය සඳහා නීතිපති වෙත යවන ලද අවසන් කෙටුම්පත් කොටස්කාර ගිවිසුමේ ඇතුළත් නොවන බව විගණනයට නිරීක්ෂණය විය. | මුදල් අමාත්‍යාංශය : මෙම ආයොජනය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල වෙත ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව තුළ ආයෝජකයා විසින් කර්මාන්තශාලාවට අවශ්‍ය යන්ත්‍රෝපකරණ රැගෙන ආ යුතු බව පැහැදිලිව දක්වා ඇතත් ඊට පටහැණිව අත්සන් තබන ලද අවසාන ගිවිසුමේ ආයෝජකයාට දැනට පවත්නා යන්ත්‍රසූත්‍ර භාවිතයට ගැනීමට හැකියාවක් ඇති බවට ඉහත කී නිලධාරියා විසින් සංශෝධනය කර ඇති බව නිරීක්ෂණය වේ.<br>කෙසේ වෙතත්, මෙම අවස්ථාව වන විට එකී නිලධාරියා මුදල් අමාත්‍යාංශයේ නීති කටයුතු දෙපාර්තමේන්තුවේ සේවය නොකරන බැව්ද සඳහන් කර ඇත. | නීති උපදේශක විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ නිෂ්කාෂණයට යවන ලද කෙටුම්පත් කොටස්කාර ගිවිසුමේ ඇතුළත් නොවන වගන්තියක් අත්සන් කරන ලද අවසාන කොටස්කාර ගිවිසුමට ඇතුළත් කිරීම පිළිබඳ විමර්ශනයක් කළ යුතුය. |
| (ඊ) කන්තලේ සීනි කර්මාන්තශාලාවට අයත් ගොඩනැඟිලි ඇතුළු යන්ත්‍ර උපකරණ අපහරණය කිරීමේ ක්‍රියාවලිය අඩාල වීම කෙරෙහි අත්සනට එළඹී කොටස්කාර ගිවිසුම හේතු වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. | ආයෝජන මණ්ඩලය : 2017.03.15 දින පැවැත්වුණු (CCEM) ආර්ථික කළමනාකරණය පිළිබඳ වූ කැබිනට් කමිටුවේදී ගන්නා ලද තීරණයට අනුව අදාළ ආයතන විසින් වැඩිදුර පැහැදිලි කිරීම් ලබා දිය යුතු වේ. | අත්සන් කරන ලද කොටස්කාර ගිවිසුමේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් වගන්තියක් ඇතුළත් නොකිරීම නිසා අපහරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබීම නිසා ඊට වගකිවයුතු පාර්ශවයන් හඳුනා ගෙන ඒ පිළිබඳව සුදුසු පියවර ගත යුතුව ඇත. |
| (උ) මුදල් අමාත්‍යාංශයේ හිටපු නීති උපදේශක විසින් අත්සනට එළඹෙන ලද කොටස්කාර ගිවිසුම සාපේක්ෂව ශ්‍රී ලංකා රජයට අවාසි සහගත වන ලෙසත්, ආයෝජකයාට හිතකර ලෙසත් පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වූ අතර සිංගප්පූරු අන්තර්ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානයේ තීරණය අනුව වන්දි වශයෙන් සිංගප්පූරු ඩොලර් 894,516.83 ක් හා ඇමරිකානු ඩොලර් 211,913.93 ක මුදලක් ශ්‍රී ලංකා රජය විසින් ආයෝජකයා වෙත ගෙවිය යුතු බවට නියම කර | මුදල් අමාත්‍යාංශය : ආයෝජකයා විසින් කර්මාන්ත ශාලාවේ යන්ත්‍ර සූත්‍ර තමාගේ භාවිතයට ලබා දිය යුතු බව ඉල්ලා සිංගප්පූරු ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානයේ බේරුම්කරණ නඩුවක් පවරන ලදී.එම නඩුව සඳහා නීතිපති දෙපාර්තමේන්තුව රජය වෙනුවෙන් පෙනී සිටින ලදී. ගරු නීතිපතිතුමාගේ උපදෙස් මත 2018 මාර්තු මස රජයේ | ශ්‍රී ලංකා රජයට අවාසිදායක කොන්දේසි ගිවිසුමට ඇතුළත් කිරීම නිසා ගෙවීමට සිදුවී ඇති වන්දි මුදල ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

ඇති බවත් එයට අමතරව ව්‍යාපෘති පිරිවැය සියයට 15 කින් වැඩිකර ඇති බවත් නිරීක්ෂණය විය.

ප්‍රධාන සාක්ෂිකරු ලෙස ඉඩම් අමාත්‍යාංශයේ හිටපු ලේකම් අයි.එච්.කේ. මහානාම මයා නම් කළ අතර ඔහු විසින් එකී නඩුව වෙනුවෙන් සාක්ෂි ලේඛනවලටද අත්සන් තබන ලදී. එකී සාක්ෂි ලේඛන බේරුම්කරණ නඩුවට ගොනු කිරීමද සිදු කොට ඇත. තත්ත්වය එසේ තිබිය දී , 2018 මැයි මස උක්ත නම සඳහන් ආයෝජකයාගෙන් අල්ලස් ලබා ගැනීමේ චෝදනාව මත ඔහු අත්අඩංගුවට ගන්නා ලද අතර බේරුම්කරණ නඩුව විභාගය වන අවස්ථාවේ ඒ සඳහා රජයේ සාක්ෂිකරුවෙකු ලෙස ඔහු රැගෙනයාම නීතිපති දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

ඒ අනුව, එම නඩුවේදී සීනි කර්මාන්ත ශාලාවේ යන්ත්‍රෝපකරණ ආයෝජකයා වෙත ලබා දිය යුතු බවට තීරණය වී ඇත. නමුත්, ආයෝජකයා විසින් ඔහුට සිදු වූ අලාභය ලෙස තක්සේරු කොට ඉල්ලා සිටි ඇමරිකානු ඩොලර් මිලියන 100 ක වන්දිය ලබා දීම බේරුම්කරණ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. ඒ සඳහා මුදල් අමාත්‍යාංශයත් නීතිපති දෙපාර්තමේන්තුවත් බේරුම්කරණ මණ්ඩලය හමුවේ කරුණු දක්වන ලදී.

නීතිපති දෙපාර්තමේන්තුව :

මෙම ගිවිසුම සම්බන්ධව ඇති වූ ආරවුල ජාත්‍යන්තර බේරුම්කරණයකින් තීරණය කරන ලදී. බේරුම්කරණ තීරණ අධිකරණ තීරණ මෙන් අභියාචනයකට ලක් කළ නොහැකිය. ඒ හෙයින් මෙම බේරුම්කරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කිරීමට නීතිමය අවකාශයක් නොමැත.

| | | |
|---|---|---|
| (ඍ) සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාල සම්බන්ධිත ආයතන වන මුදල් අමාත්‍යාංශය ,ඉඩම් ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සහ ආයෝජන මණ්ඩලය යන ආයතන අතර මනා සම්බන්ධීකරණයකින් තොරව අමාත්‍ය මණ්ඩල සංදේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම හේතුවෙන් 1994 වර්ෂයේ සිට සීනි නිෂ්පාදන කටයුතු නතර කරන ලද කන්තලේ සීනි කර්මාන්ත ආයතනය විගණිත දිනය වන විටද සුදුසු ආයෝජකයකුට පැවරීමට නොහැකි වීම හේතුවෙන් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාල තීරණ ගැනීම අප ආයතනයෙන් බැහැර කටයුත්තක් වන අතර එය අමාත්‍යාංශය විසින් ගත් තීරණ වේ. ඒ සඳහා අවශ්‍ය විස්තර අප සතුව නොමැත. | සීනි කර්මාන්තායතනයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (එ) කර්මාන්තායතනය සතු නිල නිවාස වල අනවසර පදිංචිකරුවන් 96 දෙනෙකු පදිංචිව සිටින අතර අනවසර පදිංචිකරුවන් එම නිල නිවාස වලින් ඉවත් කිරීමට කළමනාකරණය ක්‍රියා කර නොතිබුණි. | අනවසර නිවාසවල පදිංචිකරුවන් 96 දෙනා වෙත හිටපු ඉඩම් ඇමති එම්.කේ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා විසින් නිවාස තනා ගැනීමට ඉඩම් කොටසක් සීනි කම්හල භූමියෙන් ලබාදී නිවාස වලින් ඉවත් කිරීමට තීරණය කළ නමුත් එතුමා මියගිය බැවින් එය ප්‍රමාද විය. | නිල නිවාස වල පදංචි අනවසර පදිංචිකරුවන් ඉවත් කර එම නිවාස සුරක්ෂිත කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |
| (ඒ) කර්මාන්ත ශාලාවට අයත් වගාබිම් එළිපෙහෙලි කිරිම සඳහා යොදා ගන්නා ලද Jungle Cleaning නැමැති මිල අධික දම්වැලක් මෙ වන විට වල් වැදෙමින් පවතින බව විගණනයට නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත. | කර්මාන්තායතනය සතු මෙම වත්කම් විනාශවී යෑමට ඉඩ නොදී ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඔ) කර්මාන්ත ශාලාවෙහි රත්වූ ජලය ශීත කිරීමට තනා ඇති විශාල ටැංකි සමූහයෙන් හා වතුර පෙරන (Water Filtering) පද්ධතියෙහි වැසි ජලය එකතු වී මදුරුවන් බෝවන ස්ථානයක් බවට පත්ව ඇති බව විගණනයට නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත. | වැසි ජලය එකතුවීම වලක්වා පරිසරය පිරිසිදුව තබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඕ) කර්මාන්ත පරිශ්‍රයේ පවතින වාහන නිසි ආරක්ෂාවකින් හා ආවරණයකින් තොරව වසර 25 කට ආසන්න කාලයක් තිස්සේ දිරාපත් වන බව විගණනයට නිරීක්ෂණය වූ අතර ටෙන්ඩර් පටිපාටිය සඳහා වාහන වල වැසි අංක කපා ඇති නමුත් යන්ත්‍රෝපකරණ ඇතුළු වාහන වල අයිතිය ආයෝජකයාට හිමි වීම මත ටෙන්ඩර් පටිපාටිය අවලංගු වී ඇති බවත් වැසි අංක ඉවත් කිරීම හේතුවෙන් වාහන වල අනන්‍යතාව තහවුරු කර ගැනීමටද නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත. | මෙම වත්කම් අපහරණය කරන තෙක් ඒවා ආරක්ෂාකාරී ලෙස තබාගැනීමට කටයුතු කළ යුතු අතර ඒවා කඩිනමින් අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ක)වාර්ෂික සීනි මෙට්‍රික් ටොන් 16,320 ක්, මොලැෂස් මෙට්‍රික් ටොන් 9,000 ක් හා පරිපාරක ස්ප්‍රීතු ලීටර් මිලියන 3.9ක නිෂ්පාදන ධාරිතාවයකින් යුතු සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය තාවකාලිකව 1993 සැප්තැම්බර් 01 දින රජයට පවරා ගෙන තිබුණද 1994 අප්‍රේල් මස සිට සීනි නිෂ්පාදන කටයුතු සිදු නොවීම හේතුවෙන් එම ප්‍රදේශයේ ජීවත් වූ දහස් ගණනකට සෘජු හා වක්‍ර රැකියා අහිමි වී තිබුණි. තවද 1991 වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 125කට තක්සේරු කරන ලද යන්ත්‍ර උපකරණ සහ කර්මාන්ත පරිශ්‍රයේ පවතින වාහන නිසි ආරක්ෂාවක් හා ආවරණයකින් තොරව පැවතීම හේතුවෙන් භාවිතයට ගත නොහැකි තත්වයට පත්ව තිබුණි. එසේම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2012 සහ 2017 වර්ෂවල ඉදිරිපත් කල තක්සේරු වාර්තා අනුව ගත වූ වර්ෂ 5තුළ වාහන වල වටිනාකම රු.12,463,500 කින් අඩුවී තිබුණද භාවිතයට ගත නොහැකි යන්ත්‍රෝපකරණ සහ වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | යන්ත්‍රෝපකරණ සහ වාහන සඳහා දැනට වසර 25 ක පමණ කාලයක් ගතවී ඇති බැවින් ඒවා විනාශ වෙමින් පවතී. කිහිප විටක් මෙම යන්ත්‍ර උපකරණ,වාහන වෙන්දේසි මඟින් අලෙවි කිරීමට අමාත්‍යාංශය තීරණය කළ ද මේ වන තෙක් කිසිදු ක්‍රමවේදයක් නොමැත. විශාල උපකරණ තොගයක් ආරක්ෂිතව ගබඩා කිරීමට විශාල මුදලක් වැය කිරීමට සිදු වේ. | 1994 වර්ෂයේ සිට වසා දමා ඇති මෙම ආයතනය නැවත ප්‍රතිව්‍යුහගත කර සුදුසු ආයෝජකයකුට පැවරීමට සහ භාවිතයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමට අදාළ වගකිවයුතු ආයතන කටයුතු කළ යුතුය. |
| (ග) කර්මාන්ත ශාලාව සතු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 8596 ක් පමණ වන අතර හෙක්ටයාර 164 ක සීනි කම්හල හා නිල නිවාස සංකීර්ණය පිහිටා ඇත. සීනි කර්මාන්තශාලාව ක්‍රියාකාරී තත්වයෙන් තිබූ අවධියෙහි හෙක්ටයාර 4800ක් පමණ උක් වගාව සඳහා යොදවා තිබුණද වර්තමානය වන විට කිසිදු බිම් කොටසක උක් වගා කටයුතු සිදු නොවන අතර අනවසර වගා කරුවන් විසින් වී ගොවිතැන සහ අනෙකුත් වගාවන් සඳහා මෙම ඉඩම් බලෙන් අත්පත් කරගෙන තිබුණද අනවසර වගාකරුවන් ඉවත් කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | උක් ඉඩම් කට්ටිකරුවන් 647 දෙනෙකුට පමණක් අක්කර 2 ¾ ක් ලබා දී ඇති අතර අක්කර 500 ක් උක් පර්යේෂණ ආයතනයට වගා කිරීම් සඳහා ලබා දී ඇත. එම ආයතනය මඟින් අක්කර 110 ක් පමණ උක් වගා කරන අතර බීජ උක් නිෂ්පාදනයද කරනු ලැබේ.එම්.ජී. සීනි ලංකා පුද්ගලික සමාගමට ගිවිසුම් අනුව අක්කර 500 ක් ලබා දි ඇත.(බීජ උක් සහ කර්මාන්තශාලා ඉදිකිරීමට)<br>මහ කන්නය වී ගොවිතැන් කිරීමට වගාකරුවන්ට අක්කර 1 ක් රු.1000 බැගින් ලබා දී කන්නය අවසානයේදී ඔවුන් මෙම වගා බිම් අතහැර දමයි. එම ඉඩම් අනවසරෙන් අත්පත් කර ගැනීමක් නොවේ. | කර්මාන්තායතනය සතු ඉඩම් වල වසර ගණනාවක සිට කිසිදු වගාවක් සිදු නොවන නිසා එම ඉඩම් අනවසරයෙන් අත්පත් කර ගැනීම් සිදුවිය හැකි නිසා ඒවා වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ච) 2017 වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තා අනුව රු. 133,150,000 ක වටිනාකමකින් යුතු කර්මාන්තශාලා පරිශ්‍රයට අයත් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, ගබඩා කාමර, විද්‍යාගාර, සීනි ගබඩා, ආරක්ෂක ගොඩනැගිල්ල, නිල නිවාස යනාදී ගොඩනැගිලි සමූහය නඩත්තු නොකිරීම සහ ඒවාට නිසි ආරක්ෂාවක් නොමැති වීම හේතුවෙන් එම ගොඩනැගිලි බොහොමයකට වන අලින්, වඳුරන් ආදී සත්ත්වයන්ගෙන් හානි සිදුවී ඇති බව නිරීක්ෂණය විය. තවද ගබඩා වල සහ කර්මාන්ත ශාලාවන්හි ඇති ලී බඩු, යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍රෝපකරණ අමතර කොටස් ඇතුළු වටිනා තොග ද විනාශ වෙමින් පැවතුණි. | ආයතනයේ ගොඩනැඟිලි නඩත්තු කිරීමට අමාත්‍යාංශය මඟින් මුදල් වෙන් කිරීමක් සිදු නොවේ. ඒවා පිරිසිදු කිරීමට සේවකයින් ද නොමැත. ඉඩම් අමාත්‍යාංශය මඟින් යන්ත්‍රෝපකරණ සහ ගබඩා ද්‍රව්‍ය කර්මාන්ත ශාලාව වෙන්දේසි මඟින් විකිණීමට තීරණය කළද මෙතෙක් ඒ සඳහා තීරණයක් ලැබී නැත. ගොඩනැඟිලි වන අලින්ගෙන් ආරක්ෂා කර ගැනීම වනජීවී කාර්යාලයටද පොලීසියටද දැනුවත් කර ඇත. | කර්මාන්තායතනය සතු වත්කම් වලින් ප්‍රයෝජනයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමටත් අනෙකුත් වත්කම් වල ආරක්ෂාවටත් අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඡ) කර්මාන්ත ශාලාවට අයත් වටිනා ගැල්වනයිස් බට කිසිදු ආවරණයකින් තොරව අනාරක්ෂිතව ගොඩගසා තිබූ අතර තවත් යකඩ බට තොගයක් ආයතනය ආසන්නයේ ඇති හමුදා කඳවුර සහ පන්සලේ කටයුතු සඳහා ගෙන ගොස් තිබුණද ඒවා නැවත ආයතනයට ආපසු බාර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කර්මාන්තශාලාව අයත් යකඩ බට පන්සලට සහ හමුදාවට ලබා දීමට හිටපු සාමාන්‍යාධිකාරවරයාගේ අනුමැතිය ලබා දී ඇත. නැවත එම බට ලබා ගැනීම සඳහා ඉදිරියට කටයුතු කරමි. | කර්මාන්තායතනය සතු ගබඩා වල පවතින තොග ආරක්ෂිතව තබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ට) ඉඩම් අමාත්‍යාංශය මඟින් කන්තලේ සීනි කර්මාන්තායතනයේ භූමියේ පිහිටි ගොඩනැඟිලි කඩා ඉවත් කිරීම සහ භාණ්ඩ හා යන්ත්‍රෝපකරණ විකිණීම සඳහා 2017 ජුනි 05 දින මිල ගණන් කැඳවා තිබුණි. මේ සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යාංශයේ හිටපු ලේකම් සහ දැව සංස්ථාවේ හිටපු සභාපති විසින් අල්ලස් ලබා ගැනීමේ චෝදනාවට වරදකරුවන් වීම හේතුවෙන් අධිකරණය මඟින් සිර දඬුවම් නියම කර තිබුණි. ඒ හේතුවෙන් 2016 අගෝස්තු 11 දින අත්සන් කරන ලද කොටස්කාර ගිවිසුම ප්‍රකාරව කර්මාන්තශාලාව ආරම්භ කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | භාවිතයට ගත නොහැකි ගොඩනැඟිලි සහ ගබඩා භාණ්ඩ සහ යන්ත්‍ර උපකරණ අපහරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |